ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020 පෙබරවාරි 26 |

## ඉඩම් තක්සේරු දර්ශකය[1] - 2019 වසරේ දෙවන භාගය

### සුවිශේෂී කාර්යසාධනයන්


| ඉඩම් තක්සේරු දර්ශක අගය | වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වැඩිවීම |
|---|---|
| 138.9 | 10.4 % |

**අනු දර්ශකයන්හි වර්ධනය**
(වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)

| | |
|---|---|
| නේවාසික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 10.7% |
| වාණිජ ඉඩම් තක්සේරු අනු දර්ශකය | 10.3% |
| කාර්මික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 10.3% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**2017 වසරේ සිට ඉඩම් තක්සේරු දර්ශකයේ භූ ගෝලීය ආවරණය : කොළඹ දිස්ත්‍රික්කය**




2019 වසරේ දෙවන භාගය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින් ගණනය කරන ලද ඉඩම් තක්සේරු දර්ශකය 138.9 ක අගයක් වාර්තා කරන ලද අතර, එය 2018 වසරේ දෙවන භාගයේ වාර්තා වූ අගයට සාපේක්ෂව සියයට 10.4 ක වර්ධනයකි. මෙම වර්ධනය සඳහා නේවාසික, වාණිජ හා කාර්මික යන අනු දර්ශක තුනෙහිම ඉහළ යාම හේතු විය.

අනු දර්ශක අතුරින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වැඩිම ඉහළ යාම වන සියයට 10.7 ක අගය නේවාසික ඉඩම් තක්සේරු දර්ශකය මගින් වාර්තා වූ අතර, වාණිජ ඉඩම් තක්සේරු දර්ශකයෙහි සහ කාර්මික ඉඩම් තක්සේරු දර්ශකයෙහි ඉහළ යාම සියයට 10.3 ක් විය. මේ අතර, සමස්ථ ඉඩම් තක්සේරු දර්ශකය 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2019 වසරේ දෙවන භාගයේ දී සියයට 5.1 කින් ඉහළ යන ලදී.

**ඉඩම් තක්සේරු දර්ශකයෙහි විචලනය**




**ඉඩම් තක්සේරු දර්ශකයෙහි වර්ධනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[1] ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන ඉඩම් මිල දර්ශකය 2019 දෙවන කාර්තුවේ සිට ඉඩම් තක්සේරු දර්ශකය ලෙස ප්‍රතිනාමකරණය කර ඇත.

## ඉඩම් තක්සේරු දර්ශකය සහ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය

| කොළඹ දිස්ත්‍රික්කය සඳහා ඉඩම් තක්සේරු දර්ශකය (පදනම් වර්ෂය: 2017 වසරේ පළමු භාගය) | දර්ශක අගය | | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය (සියයට) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 පළමු භාගය | 2017 දෙවන භාගය | 2018 පළමු භාගය | 2018 දෙවන භාගය | 2019 පළමු භාගය | 2019 දෙවන භාගය | 2018 පළමු භාගය | 2018 දෙවන භාගය | 2019 පළමු භාගය | 2019 දෙවන භාගය |
| නේවාසික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 100.0 | 107.0 | 116.5 | 125.0 | 131.4 | 138.4 | 16.5 | 16.8 | 12.8 | 10.7 |
| වාණිජ ඉඩම් තක්සේරු අනු දර්ශකය | 100.0 | 107.3 | 116.8 | 125.9 | 132.2 | 138.8 | 16.8 | 17.4 | 13.2 | 10.3 |
| කාර්මික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 100.0 | 106.0 | 115.8 | 126.6 | 133.0 | 139.6 | 15.8 | 19.4 | 14.9 | 10.3 |
| **ඉඩම් තක්සේරු දර්ශකය** | **100.0** | **106.7** | **116.3** | **125.8** | **132.2** | **138.9** | **16.3** | **17.9** | **13.6** | **10.4** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### තාක්ෂණික සටහන:

#### ආවරණය සහ කාල පරාසය

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය වන පරිදි 1998 සිට 2008 දක්වා වාර්ෂිකව ද 2009 සිට 2017 දක්වා අර්ධ වාර්ෂිකව ද ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරන ලදී. ඉන්පසු 2007 වසරේ සිට කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ම ඇතුලත් වන පරිදි මෙම දර්ශකයේ භූගෝලීය ආවරණය පුළුල් කර, පදනම් වර්ෂය 2017 පළමු භාගය ලෙස සංශෝධනය කරන ලදී. මෙම ඉඩම් මිල දර්ශකය 2019 දෙවන භාගයේ සිට ඉඩම් තක්සේරු දර්ශකය ලෙස ප්‍රතිනාමකරණය කර ඇති අතර එය අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

#### දත්ත මූලය

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අර්ධ වාර්ෂිකව එක්රැස් කරගනු ලබන හිස් ඉඩම් පර්චසයක් සඳහා වන මිල ගණන් මේ සඳහා භාවිතා කෙරේ.

#### ක්‍රමවේදය

ඉඩම් භාවිතය සම්බන්ධයෙන් පවත්නා විවිධත්වය සහ සමජාතීත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාව යන කරුණු සැලකිල්ලට ගනිමින්, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඒ ඒ ප්‍රදේශයේ එක් එක් කාණ්ඩයට අයත් ඉඩම් පර්චසයක සාමාන්‍ය මිල උපයෝගී කර ගනිමින් නේවාසික, වාණිජ හා කාර්මික ඉඩම් කාණ්ඩ සඳහා අනු දර්ශක තුනක් ගණනය කරනු ලැබේ. එම අනු දර්ශක තුනෙහි සාමාන්‍යය ඇසුරෙන් ඉඩම් තක්සේරු දර්ශකය ගණනය කරනු ලැබේ.